**ගලේවෙල ප්‍රාදේශීය සභාව.**

**-----------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**----------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ගලේවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

අය විෂයයන් 10ක ආදායම් උපචිත පදනම ගිණුම්ගත කරන බව අනාවරණය කර තිබුණද, මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් වල එකතුව හා ප්‍රාග්ධන යෙදුමට අදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය අතර වසර 12 කට පෙර සිට පවතින රු.2,306,910 ක වෙනස සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සභාවේ ගොඩනැගිලි සංවර්ධනය සඳහා අවස්ථා 03කදී වැය කර තිබුණු රු.4,345,878 ක වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සභාව සතු සුසාන භූමි 80 කටඅයත් අක්කර 109.5 ක් හා පර්චස් 25 ක ඉඩම් ප්‍රමාණය තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) දීර්ඝකාලීන බදු පදනම මත ලබාගෙන තිබුණු රු.600,000 ක් වටිනා දොරකැටිවල ඉඩම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ සටහනක් මඟින් අනාවරණය කර නොතිබුණි.

(ඉ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව අංක WPRV – 2765 දරන ගලි බවුසරයේ වටිනාකම රු.3,000,000 ක් වුවත්, රු.300,000 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.2,700,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ස්ථාවර වත්කම් ලේඛනයේද ඇතුළත් නොවන වටිනාකම සොයාගත නොහැකි අංක 46-4418 දරන පැරණි ජල බවුසරය හා රු.97,850 ක් වටිනා අංක 52343 දරන තණකොළ කපන යන්ත්‍රයෙහි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතුව පැවති ජලනල උපාංග තොගය රු.676,585ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඌ) කර්මාන්ත ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය රු.284,492ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ පළාත් සභා මන්ත්‍රී ආධාර යටතේ නිමකළ ව්‍යාපෘතියක ණය හිමි ශේෂය 175,043 ක් වැඩියෙන් දැක්වුණි.

(ඒ) පුස්තකාල සාමාජිකයින්ගෙන් අයකර තිබු නැවත නොගෙවන තැන්පතු රු.41,200ක් ආදායමට ගැනීමෙන් තොරව තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඔ) සභා බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම හා ආදායම් ණයගැතියෝ රු.132,393 කින් අඩුවෙන් දැක්වුණි.

(ඕ) වෙළඳ සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් ටෙන්ඩර් ලාභීන්ගෙන් වර්ෂය තුළ ලැබී තිබුණු රු.2,717,250 ක මුදල ප්‍රාග්ධන ලැබීම් යටතේ හා එම ඉදිකිරීම් වෙනුවෙන් ගෙවීම් කර තිබු රු.7,218,237 ක් ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කිරීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමට බැර හා හර කර තිබුණු අතර, ලැබිය යුතු රු.15,584,000 ක වටිනාකම් ණයගැතියන් යටතේ දක්වා නොතිබුණි.

1.3.3 නොසැසඳුනු පාලන ගිණුම්

------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.278,741,097 ක් වූ ගිණුම් විෂයයන් 03කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.107,294,030 ක අසමානතාවයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුමේ හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල තොග ශේෂයන් අතර රු.2,935,427 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 <u>ලැබිය යුතු ගිණුම්.</u>

දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.1,086,634 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක වටිනාකම නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද පියවර ගෙන නොතිබුණි.

1.3.5 <u>ගෙවිය යුතු ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 2ක වටිනාකම රු.13,981,626ක් වූ අතර, වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින එකතුව රු.3,630,183ක් වූ ශේෂ ඊට ඇතුළත්ව තිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයන් 02 කට අදාළ එකතුව රු.12,982,570 ක් වූ ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය

1.3.7 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන වලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) 212 රීතිය | | මිලදීගත් රු.364,905 ක් වටිනාකම වූ ගබඩා ද්‍රව්‍ය තොග පොත්වල ඇතුලත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) | මුදල් රෙගුලාසි 189 | 2003-2006 වර්ෂ වලදී ලැබී අගරු වී තිබුණු එකතු වටිනාකම රු.60,517 ක් වූ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 570, 571 | වසර 02ක් ඉක්ම වූ එකතු වටිනාකම රු.1,579,021ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි 1645 | 2012 සිට 2015 දක්වා කාලයට අදාළව සභාවේ වාහන 17 ක් වෙනුවෙන් දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2015 ජූලි 14 දිනැති අංක 4/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | රක්ෂණ පහසුකම් ලබාගැනීමේදී මිල ගණන් කැඳවා සෘජුවම රක්ෂණ පහසුකම් ලබාගත යුතු වුවත් මිල කැඳවීමකින් තොරව රක්ෂණ නියෝජිතයින් මඟින් අවස්ථා 07 කදී රු.431,376 ක මුදලකට රක්ෂණ ආවරණ ලබාගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

--------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.10,369,664 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.9,836,141 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.533,523 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------

(අ) මූල්‍ය ප්‍රතිඵලයේ රු.533,523 ක වර්ධනයට ආදායම් විෂයයන් 02 ක වැඩිවීම හා වියදම් විෂයයක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) වැඩසටහන් අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන ආදායම් හා වියදම් සසඳා බැලීමේදී වැඩසටහන් 06 න් වැඩසටහන් 03 ක ආදායම ඉක්මවූ වියදමක් දක්නට ලැබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් 03 ක ප්‍රාග්ධන ලැබීම් ඉක්ම වූ ප්‍රාග්ධන වියදම රු.9,526,899 ක් විය.

2.3 ආදායම් පරිපාලනය

--------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් පවත්වාගෙන යන ජල සැපයුම් සඳහා සවිකර තිබූ අක්‍රීය ජල මනු සක්‍රීය කර ජල ආදායම වැඩි කර ගැනීමට කටයුතු නොකර ස්ථාවර ජල ගාස්තු අයකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ජල ආදායම රු.1,444,162 ක් වූ අතර ජල වියදම රු.2,392,488 ක් වූයෙන් වියදම පියවා ගැනිමටවත් ආදායමක් උපයා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සභාව සතු වත්කම් බදුදීමේදී වර්ෂ 05 කට වරක් බදුකුලිය සංශෝධනය කර ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.2 වරිපනම් බදු

-------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.1,278,997 ක් වූ අතර එම ශේෂය තුළ වසර 05 ට වඩා වැඩි කාලයක් ඉක්ම වූ රු.417,040 ක ශේෂයක් ද ඇතුළත් වී තිබුණි.

2.3.3 අක්කර බදු

-------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.47,967 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළ රු.2,762 ක් පමණක් අයකරගෙන තිබුණු අතර එය මුළු හිඟයෙන් 5% ක අගයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟහිටි අක්කර බදු ශේෂය රු.55,974 ක් වූ අතර එම ශේෂය තුළ වසරකට වඩා වැඩි කාලයක් ඉක්ම වූ රු.45,205 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.3.4 ජල ගාස්තු

----------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.106,724 ක් වූ අතර එම ශේෂය තුළ වසරකට වඩා වැඩි කාලයක් ඉක්මවූ රු.49,322 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.3.5 විනෝද බදු

-----------

වසර 10 කට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින හිඟහිටි විනෝද බදු ශේෂය රු.6,948 ක් වූ අතර එම ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

2.3.6 බලපත්‍ර ගාස්තු

--------------

වසර 05 කට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින හිඟහිටි බලපත්‍ර ගාස්තු රු.691,370 ක් වූ අතර එම ශේෂය නිරවුල් කරගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

2.3.7 මස්කඩ කුලී

------------

වසර 05 කට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින හිඟහිටි මස් කඩ කුලී ශේෂය රු.84,580 ක් වූ අතර එම ශේෂය නිරවුල් කරගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

2.3.8 දැන්වීම් පුවරු ගාස්තු

----------------------

සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරණ දැන්වීම් පුවරුවලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ 7(ඊ) හා xxx උපවගන්තිවල විවිධාන අනුව රු.132,393ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

2.3.9 පාරිසරික බලපත්‍ර ගාස්තු

-------------------------

සභා බල ප්‍රදේශයේ පරිසර බලපත්‍ර ලබාගත යුතු වෙළඳ ව්‍යාපාර 90 ක් පිළිබඳ 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත අංක 47 දරන ජාතික පාරිසරික පනත හා 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය අනුව පරික්ෂා කර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3.10 බදු කුලී

----------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු වෙළඳ සංකීර්ණ 06 ක තක්සේරු බදුකුලිය අවසන් වරට සංශෝධනය කර වසර 15 ක් ගත වී තිබුණද බදුකුලී සංශෝධනය කර ගිවිසුම් අළුත්කිරීමට කටයුතු කර නොතිබුණි. තවද කඩ කාමර අතුරු බදුදිය නොහැකි වුවද වෙනත් පුද්ගලයන් වෙත ලබාදී තිබූ කඩ සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) ගලේවෙල නගරයේ නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 26ක් තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුවකින් තොරව කඩ කාමරයක ඇස්තමේන්තුගත පිරිවැයට ටෙන්ඩර් කර බදු දී තිබුණි. මෙම බදුකරුවන් ගිවිසුම් ප්‍රකාරව එකවර ගෙවීමේ මුදල් ගෙවා නොතිබීම නිසා රු.6,120,025 ක මුදලක් අයවිය යුතුව තිබුණද ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි

(ඇ) බිම් සවිය කාර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා සභාව සතු ගොඩනැගිල්ලක් තක්සේරු කිරීමකින් තොරව 2013 අප්‍රේල් 24 දින සිට රු.25,000 ක මාසික බදුකුලියක් මත බදු දී තිබුණි.

2.3.11 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.2,848,550 ක මුදලක් සහ මුද්දර ගාස්තු වශයෙන් රු.11,058,272 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.4 අධිභාර

-------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂ වලදී පනවන ලද අධිභාර වලට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.118,100 මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ සේවක පුරප්පාඩු 16 ක් හා අතිරික්ත තනතුරු 12ක්ද පැවතුණි.

(ආ) විධිමත් තක්සේරු කිරීමකින් තොරව රු.522,091,000 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් කර තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගලේවෙල නගරයේ මාර්ග පළුදු කිරීමේදී හානිවන ජලනල සඳහා එලීමට මාර්ග සංවර්ධන අධිකාරියෙන් ප්‍රාදේශීය සභාවට ලබාදී තිබුණු රු.1,173,405 ක් වටිනා ජලනල උපකරණ අවශ්‍යතාවය මත නිකුත් කිරීමේ නියෝග මඟින් නිකුත් නොකර සම්පූර්ණ තොගයම ජල කම්කරුවෙකු වෙත ලබා දී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රජාශාලා ඉදිකිරීම සඳහා 2015 වර්ෂයේදී කොන්ත්‍රාත් කරුවෙකුට රු.748,110 ක වටිනාකමට ඉදිකිරීම් ද්‍රව්‍ය ලබාදී තිබූ නමුත් එම ද්‍රව්‍ය යොදා ඉදිකිරීම් කළ බවට මැනුම්පත් හා තාක්ෂණික නිලධාරී වාර්තා නොතිබුණු අතර මෙම ප්‍රජාශාලා සභාව වෙත පවරා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ප්‍රතිලාභීන්ට බෙදාහැරීම සඳහා මිලදීගත් රු.746,295 ක් වටිනා ජල ටැංකි හා ප්ලාස්ටික් පුටු ප්‍රතිපාදන අනුමත කළ ලිපිය අනුව 2015 නොවැම්බර් 15 වන විට බෙදාහැරීම් නිමකළ යුතු වුවත්, 2016 මාර්තු 02 වන විටත්, බෙදා හැර නොතිබුණි.

(ඈ) විවිධ ආයතන හා පුද්ගලයින්ගේ ඉල්ලීම අනුව ඇස්තමේන්තු සැකසීමකින් හා විධිමත් අනුමැතියකින් තොරව මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සේවයේ යොදවා තිබුණු අතර, ඒ සඳහා රු.85,248ක ඉන්ධන වියදම් දරා තිබුණි.

3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

---------------------------------

ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රජා සංවිධාන මඟින් පවත්වාගෙන යන ජල යෝජනා ක්‍රමයක අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් ගැටළු සහගත තත්වයකට පත්ව තිබුණි.

මෙම ජල යෝජනා ක්‍රමය අධීක්ෂණයට ලක්කර ආදායම් තත්ත්වය නගා සිටුවා අවශ්‍ය වත්කම් එහි ආදායමින් ලබාගැනීමට සැලැස්විය යුතු වුවත් එසේ නොකර පොදු අරමුදලින් රු.254,555 ක් වැයකර ජල මෝටරයක් හා උපාංග ලබාදී තිබුණි.

3.4 හඳුනාගත් අලාභ

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පොදු අරමුදල් හා ටෙන්ඩර් ලාභීන්ගෙන් ලබාගත් අරමුදල් යොදවා ගලේවෙල නගරයේ රු.2,679,804 ක මුදලක් වැයකර 2015 වර්ෂය මාළු වෙළඳසැල් සංකීර්ණයක් ඉදිකර තිබුණි. මෙම වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ දී අදාළ ආයතනවලින් අනුමැතියක් ලබා නොගෙන ඇළ ඉවුරක නියමිත ප්‍රමිතියකින් තොරව ඉදිකිරීම හේතුවෙන් වර්ෂාවත් සමඟ ඇළේ පැති බැම්මටද හානි සිදුව කඩකාමර 02 ක් මුළුමනින්ම විනාශ වී අනෙක් කඩකාමර 03 ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයට පත්වීම නිසා වැයකර තිබූ මුදලම සභාවට අලාභයක් වී තිබූ බව2015 නොවැම්බර් 27 දින කරන ලද භෞතික නිරීක්ෂණයේදී අණාවරනය විය.

(ආ) ඉකුත් වර්ෂයේ දී පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු වටිනාකම රු.28,785ක යකඩ බට 26 ක ඌනතාවය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

සභාව සතු අංක WPRV – 2765 දරන රු.3,000,000 ක් වටිනා ගලිබවුසරය හා අංක 73-4153 දරන රු.79,000 වටිනා කුබෝටා අත්ට්‍රැක්ටරය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

-------------------------------

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය 2016 ජනවාරි මාසයේදී සිදුකර තිබුණි. මෙම භාණ්ඩ සමීක්ෂණයෙන් පසු 2016 අප්‍රේල් 05 දින විගණන පරීක්ෂාවේදී ගබඩාවේ තිබූ රු.1,121,143 ක් වටිනාකම වූ ජලනල තොගයක් මෙම සමීක්ෂණයෙන් අත්හැරී තිබීම හේතුවෙන් මෙම සමීක්ෂණ වාර්තාව අසම්පූර්ණ විය.

3.6 අවිධිමත් ගණුදෙනු

-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියට අනුකූල නොවී සමාලෝචිත වර්ෂය සඳහා සුභපැතුම්පත් මිලදී ගැනීම වෙනුවෙන් රු.28,500 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) රජයේ සේවකයෙකු නොවන විවිධ ආයතනවල කොන්ත්‍රාත්කරුවකු ලෙස කටයුතු කර තිබුණු පුද්ගලයෙකු විශ්‍රාම ගිය තාක්ෂණික නිලධාරියෙකු ලෙස බඳවාගෙන 2014 අගෝස්තු සිට 2015 ජූනි දක්වා රු.251,600 ක් දීමනා ගෙවා තිබුණ ද පාලාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයන්ගේ ධූරකාලය 2015 මැයි 15 දිනෙන් අවසන් වී තිබුණද, මැයි මාසය සඳහා මන්ත්‍රී ඉන්ධන හා දුරකථන දීමනාව සම්පූර්ණ මාසයටම ගෙවීම් කිරීම හේතුවෙන් රු.23,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.7 කොන්ත්‍රාත් පරිපාලනය
------------------------

(අ) තෙන්නකෝන්පුර ගල්වැඩියාව පාර කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීම.
--------------------------------------------------------------------------------

පළාත් නැගුම ප්‍රතිපාදන යටතේ සංවර්ධනය කල යථෝක්ත මාර්ගයේ වර්ග මීටර් 602.7 ක කොන්ක්‍රීට් කුට්ටි ගල් 24108 ක් ඇතිරීම සඳහා එකකට රු.38 බැගින් රු.916,104 ක් ගෙවා තිබුණද, ගෙවිය යුත්තේ වර්ග මීටර් 560.66 කට කුට්ටි ගල් 22462 ක් සඳහා රු.852,188 ක මුදලක් බැවින් රු.65,916 ක් වැඩිපුර ගෙවා තිබුණි.තවද මාර්ගයේ ස්ථාන 02 කින් කුට්ටි ගල් ගිලා බැස තිබුණි.

3.8 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
------------------------------

මධ්‍යම පළාත් පරිසර අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රුපියල් මිලියන 03 ක ආධාර යටතේ සභාව විසින් 2010 වර්ෂයේදී ආවරණ සහිත කසල බැහැර කිරීමේ කාණු 02 ක් (100”x25”) හා කසළ තේරීම සඳහා අංගනයක් සහිත ස්ථානයක් ඉදිකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ද රු.700,000 ක් වැය කර කොම්පෝස්ට් අංගනයේ වහලය අළුත්වැඩියා කර තිබුණි.
සභා බල ප්‍රාදේශයේ දෛනිකව එකතු වන මෙට්‍රික් ටොන් 2.5 පමණ කසළ වලින් දිරන අපද්‍රව්‍ය කාණු පද්ධතියට යොමු කර තිබුණද, අංක 1 කාණුවේ කසළ දිරාපත් වීමේ ක්‍රියාවලිය නිසි ආකාරයෙන් සිදුවී නොතිබුණි. අංක 02 කාණුව පහත් බිම් ප්‍රදේශයක පිහිටා තිබීම නිසා වැසි ජලය ගලා යෑම හේතුවෙන් භාවිතයට ගත නොහැකි තත්වයකට පත්ව තිබූ අතර විශාල මුදලක් වැය කර තිබූ මෙම ව්‍යාපෘතිය අසාර්ථක තත්ත්වයේ පැවතුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය
--------------------------------------

4.1 අයවැය පාලනය
-----------------

සමාලෝචිත වර්ෂය තුලදී ආදායම් හා වියදම් විෂයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 06 ක එකතුව රු.172,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) වැය විෂයයන් 50 ක ප්‍රතිපාදන වලින් රු.4,285,500 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම සිදු කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 40 කට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර 9% සිට 180% දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

---------------------

1988 (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වාගෙන තිබුණද අභ්‍යන්තර විගණන නිලධාරියාට කාර්යාලයේ අනෙකුත් රාජකාරීද පවරා තිබීම හේතුවෙන් සාර්ථක අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක CPC/CLG/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම එකී කමිටු පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) වාහන පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) ණයගැති හා ණයහිමි පාලනය
(ඊ) මනව සම්පත් කළමනාකරණය